සී/ස ලංකා නැව් සංස්ථාව - 2023/2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස ලංකා නැව් සංස්ථාවේ 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ ව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 38 හි 9 හා 21 වගන්තිවලට අනුව යම්කිසි අස්පෘශ්‍ය වත්කමක් මඟින් ආයතනයට අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම හව්‍ය වේ නම් හෝ අදාළ වත්කමේ පිරිවැය විශ්වාසදායී ලෙස මැනිය හැකි නම් එම අස්පෘශ්‍ය වත්කම අත්පත් කර ගැනීම වෙනුවෙන් දරන ලද පිරිවැය වත්කමක් ලෙස හඳුනාගත යුතු වුවත් සමාගම විසින් 2020 නොවැම්බර් 10 වන දින සමාගම වෙත අත්පත් කරගැනීමට ගිවිසුම් ගත වූ පරිගණකගත නැව් කළමනාකරණ පද්ධතියේ සැලසුම්ගත නඩත්තු පද්ධතිය, කාර්යය මණ්ඩල මොඩියුලය සහ HSEQ මොඩියුලය වෙනුවෙන් දැනට දරන ලද රු.මිලියන 4.5 ක මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අස්පෘශ්‍ය වත්කම් යටතේ ගිණුම්ගත	පරිසනකගත නැව් කළමනාකරණ පද්ධතිය විගණනය කරන ලද 2020/21 ගිණුම් වර්ෂයේදී වියදමක් ලෙස හඳුනා ගෙන ඇත. 2024/2025 වර්ෂයේදී මෙය වත්කමක් ලෙස හඳුනාගැනීමට කටයුතු කරමින් පවතී.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38 අනුව අස්පෘශ්‍ය වත්කම් හඳුනාගැනීමට හා ගිණුම්ගත කිරීමට කළමනාකරණය පියවර ගත යුතු බව.

	නොකර 2020/21 මූල්‍ය වර්ෂයේදී වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එබැවින් අස්පෘශ්‍ය වත්කම් රු.මිලියන 4.5 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර එම වර්ෂයේ වියදම රු.මිලියන 4.5 කින් වැඩියෙන් දක්වා තිබුණි.		
(ආ)	සමාගමට අයිති නව ඉඩම වටා ඉදිකරන ලද 2023 අගෝස්තු 23 දිනට වැඩ නිම කළ වැට සම්බන්ධයෙන් දරන ලද රු.මිලියන 1.5 ක පිරිවැය කෙරීගෙන යන වැඩ තුළ ඇතුළත්ව තිබූ නමුත් 2024 මාර්තු 31 දින වන විටත් ප්‍රාග්ධනිත කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය තුළ වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. තවද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 55 වගන්තියට අනුව වත්කමක් භාවිතයට ගන්නා පළමු අවස්ථාවේ සිටම එම වත්කම ක්ෂය කිරීම කළ යුතු වුවද වර්ෂයට අදාළ ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.	වැට ඉදිකිරීමට අදාල ප්‍රසම්පාදන පටිපාටියෙහි, තාක්ෂණික වාර්තාවෙහි, ටෙන්ඩර් මණ්ඩලයෙහි, ඉන්වොයිසියෙහි සහ වැට පරික්ෂා කිරීමට පත් කල කමිටු වාර්තාවෙහි තාවකාලික ඉදිකිරීමක් ලෙස දක්වා ඇති අතර තහඩු භාවිතා කරමින් ඉදිකළ තාවකාලික වැටකි. LKAS 16 හි 50 හා 57 වගන්තින් පරිදි ක්ෂය කිරීමේදී ඵලදායි ජීවකාලය විශ්වාසනීය ලෙස මැනීම ප්‍රයෝගික නොවන කටයුත්තකි. එම නිසා මෙම තාවකාලික වැට වත්කමක් ලෙස හඳුනාගෙන නොමැත.	කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර ඇති වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 අනුව ප්‍රාග්ධනිත කිරීමට කළමනාකරණය පියවර ගත යුතු බව.
(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 29 වගන්තියට අනුව සමාගමක් එහි දේපළ, පිරියත හා උපකරණ වත්කමක් ලෙස හඳුනාගැනීමෙන් පසු එහි වටිනාකම මිනුම් කිරීමේදී පිරිවැය ක්‍රමය හෝ ප්‍රත්‍යාගණන ක්‍රමය භාවිතා කළ යුතු අතර එය ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අනාවරණය කළ යුතුය. නමුත්, සමාගම විසින් දේපළ, පිරියත හා උපකරණ පිරිවැය ක්‍රමයට මිනුම් කරන බව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ඇතත් සමාගමේ රු.මිලියන 225.7 ක් වටිනා ඉඩම ගිණුම්ගත කිරීමේදී වෙළඳපල වටිනාකම පදනම් කරගෙන තිබුණි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 29 වගන්තිය ප්‍රකාරව පිරිවැය හෝ ප්‍රත්‍යාගණන ක්‍රමය භාවිත කිරීමට සමාගමට හැකි අතර, ඒ අනුව සමාගමේ ගිණුම් ප්‍රතිපත්ති ප්‍රකාශයේ 3.4 හි ඉඩම ප්‍රත්‍යාගණන ක්‍රමයට පවත්වාගෙන යන බවට සඳහන් කර ඇත. කළමනාකාරීත්වයේ අනුමැතියද ඇතිව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 32 වගන්තිය අනුව මෙම ඉඩම වරලත් තක්සේරුකරුවෙකු ලවා ප්‍රත්‍යාගණන කරවාගෙන ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 අනුව යම්කිසි දේපළ පිරියත හා උපකරණ අයිතමයක් මුල්වරට හඳුනාගැනීමෙන් පසුව ප්‍රත්‍යාගණිත අගයට මිනුම් කරන්නේ නම් පසුකාලීන මිනුම් කිරීම යටතේ (Subsequent Measurement) නිවැරදිව අනාවරණය කිරීමට කළමනාකරණය පියවර ගත යුතු බව.
(ඈ)	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 හි 4.1.2 (A) වගන්තියට අනුව ආයතනයක් මූල්‍ය වත්කම් වර්ගීකරණය කිරීමේදී එහි සාධාරණ අගය (Fair value through other	අප විසින් මූල්‍ය වත්කම් වටිනාකම අගය කිරීමේ දී (Quoted Investment) Mercantile Shipping Company PLC හි වාර්ෂික වාර්තා (2023/24) ප්‍රසිද්ධියට ලක්කර	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 09 අනුව මූල්‍ය වත්කම් අගය කිරීම නිවැරදිව සිදු

comprehensive income) පදනම් කරගත යුතු අතර ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 (SLFRS 9) හි 4.1.4 වගන්තියට අනුව සමාගම විසින් එහි මූල්‍ය වත්කම් වටිනාකම අගය කිරීමේදී (Quoted investment) සාධාරණ අගය පදනම් කරගෙන අගය කළ වුවත් එසේ නොකිරීම හේතුවෙන් මූල්‍ය වත්කම්වල වටිනාකම රු.මිලියන 9.9 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	නොතිබිණි. එම නිසා එම අවස්ථාවේ පැවති වෙළඳපල අගය පදනම් කරගෙන Mercantile Shipping Company මූල්‍ය වත්කම් වටිනාකම ගණනය කොට ඇති අතර එහි වාර්ෂික වාර්තා ප්‍රසිද්ධියට පත් කල පසු අප විසින් එය නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.	කිරීමට හා ගිණුම්ගත කිරීමට කළමනාකරණය පියවර ගත යුතු බව.

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාගමේ ණයගැතියෙකු වෙතින් සනාථ කරගෙන තිබූ ණය ශේෂය හා සමාගමේ ණයගැති ශේෂය අතර රු.මිලියන 8.1 ක වෙනසක් දක්නට ලැබුණි.	M/S Mur Shipping Ltd ආයතනය 31/03/24 දිනට ගෙවිය යුතු ශේෂය ඇ.එ.ජ. ඩොලර් (USD) 58,505.99 ක් ලෙස සනාථ කර ඇති නමුත් පොත්වල සටහන් කර තිබූ USD 31,609.18 ක ලැබිය යුතු ශේෂය නැව් කුලියට දීමේ අංශයේ දැනුම් දීම මත ඉදිරිපත්කර ඇති ඉන්වොයිස් පත්‍ර වල සටහන් කර තිබූ ඒවා බව පැහැදිලි කළ යුතුය.	ආයතනයේ ඒ ඒ අංශ අතර විධිමත් සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාමටත් ණයගැති ශේෂයන් ශේෂ සනාථ සමඟ සැසඳීමෙන් පසු අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමටත් කළමනාකරණය විසින් පියවර ගත යුතු බව.
(ආ)	වෙළඳ ලැබිය යුතු දැ සඳහා හානිකරණ ගැලපීමේ දී (Impairment) තනි තනිව ආයතන වෙනුවෙන් ප්‍රතිපාදනය කර තිබූ රු. මිලියන 161.2 ක් හා සාමූහිකව ප්‍රතිපාදනය කර තිබූ රු.මිලියන 1,096.6 ක් වූ වටිනාකම සඳහා තාර්කික පදනමක් හෝ ලබාගත් විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.	ආයතනයට ලැබිය යුතු දැ (Debits) සඳහා ප්‍රතිපාදන (Impairment) 2013/14 වර්ෂයේ සිට සිදුකල අතර එය එම වර්ෂයේ සිට විගණනය කල විගණන සමාගම්වල උපදෙස් මත සහ ඉහල කළමණාකාරිත්වයේ උපදෙස් මත සිදුකරන ලදී.	තාර්කික පදනම් හා විධිමත් අනුමැතින් යටතේ හානිකරණ ගැලපීම් සිදු කිරීමට පියවර ගත යුතු බව.

1.5.4 සමාගමේ අඛණ්ඩ පැවැත්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ලාභය රු.මිලියන 763.2 ක් වූ අතර සමුච්චිත පාඩුව රු.මිලියන 9,979.2 ක් විය. තවද, 2024 මාර්තු 31 දිනට සමාගමේ ශුද්ධ	අතිවිශේෂ මහා සභා රැස්වීම්වලදී යෝජිත ව්‍යාපෘතින්හි තත්ත්වය පහත පරිදි වේ. i. පාවෙන නාවික ඉන්ධන ගබඩාවක් ක්‍රියාත්මක කිරීම -	සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිතතාවය මඟ හරවා ගැනීම සඳහා අවශ්‍ය

වත්කම්වල අගය රු.මිලියන 8,358.2 ක සෘණ අගයක් විය. සමාලෝචිත වර්ෂයේ ලාභයක් පෙන්නුම් කිරීම හේතුවෙන් පෙර වර්ෂයේ අලාභය සියයට 141.10 කින් අඩුවී ඇති අතර සමාගමේ ශුද්ධ වත්කම්වල සෘණ ශේෂය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 9.25 කින් පහළ ගොස් ඇතත් ඒ අනුව සමාගමේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධව පවතින අවිනිශ්චිතතාව තවදුරටත් එලෙසම පැවතුණි. සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂවල සමුච්චිත පාඩුවලට ප්‍රධාන හේතුව වූයේ එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො) ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කිරීමෙන් පැනනැඟුණු විනිමය අලාභයයි. මෙම තත්ත්වය මගහරවා ගැනීම සඳහා 2023 මාර්තු 24 වැනි දින පැවති විශේෂ මහසභා රැස්වීමේදී (EGM) සමාගම ක්‍රියාමාර්ග යෝජනා කර තිබුණද, එම විනිමය අලාභය අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.	මූලික ප්‍රාග්ධනය නොමැතිවීම හේතුවෙන් ප්‍රමාද විය. ii. ශ්‍රී ලංකා ධජයේ ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීම - වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ අනුමැතිය ලැබී නොමැත. iii. මගීන් සහ නොරොච්චෝලේ භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා බෝට්ටුවක් ඉදිකිරීම - මූලික අධ්‍යයන කටයුතු සිදුකළද මෝසම් කාලය තුළ බෝට්ටුව යෙදවීම සඳහා සුදුසු ව්‍යාපාරික කටයුතු අවම හෙයින් ව්‍යාපෘතිය ඇණ හිටිණි. iv. කන්කසන්තුරේ සිට නම් කරන ලද ඉන්දියන් වරායන්/ වරායක් අතර මගී සහ නාවික භාණ්ඩ ප්‍රවාහන යාත්‍රාවක් ක්‍රියාත්මක කිරීම - අයදුම්කරුවකු හා අවබෝධතා ගිවිසුමකට එළඹ සිටියි. v. ශ්‍රී ලංකාව හා බංගලාදේශය අතර බහාලුම් පෝෂක සේවාවක් ක්‍රියාත්මක කිරීම - ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රථම සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටිය රටවල් දෙක විසින් යෝජනා කෙරුණද බංගලාදේශ පාර්ශවයේ එකගතාවය ඊට ලැබී නොමැත.	ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතු බව.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාගමට අයවිය යුතු වෙළඳ ණයගැති වටිනාකම රු.මිලියන 1,744.6 ක් වන අතර එයින් වසර 06 කට වඩා වැඩි කාලයක සිට අයකර ගත නොහැකි වෙළඳ ණයගැති වටිනාකම රු.මිලියන 1,104.9ක් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	ණය අයකර ගැනීමේ කමිටු ක්‍රියාමාර්ග ඇතුළත් වාර්තාව විගණන කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව, වසර 10 ඉක්මවූ ණය ශේෂ "බොල් ණය" ලෙස අහෝසි කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු සලසා තිබේ.	ණයගැතියන්ගෙන් මුදල් එකතු කර ගැනීම සඳහා විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් අනුගමනය කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතු බව.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 ජාතික විගණන පනතේ 16.2 වගන්තිය සහ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය	ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාගමේ මූල්‍ය ප්‍රකාශන දින 63 ක ප්‍රමාදයකින් යුතුව විගණනය වෙත ඉදිරිපත්කර තිබුණි.	සී/ස ලංකා නැව් සංස්ථාවේ සේවක පුරප්පාඩු ගැටලුව නිසා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු කාලසීමාව පසු විය.	ජාතික විගණන පනත හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ උපදෙස් පරිදි ගිණුම් වර්ෂය අවසන් වී අදාළ කාලය තුළ සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු බව.

1.8 බදු රෙගුලාසි වලට අනුකූල නොවීම.

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 82 (ඇ) ii උප වගන්තිය අනුව ආයතනයක් විසින් එහි ආදායම් බදු, තක්සේරු වර්ෂය අවසානයේ සිට මාස හයක් සම්පූර්ණ වන දිනයේදී ගෙවිය යුතු වුවත් සමාගම විසින් 2023/24 වර්ෂයට අදාළව ආදායම් බදු රු.මිලියන 380.6 ක් නියමිත කාලය තුළ ගෙවා නොතිබීම හේතුවෙන් දඩය සහ පොලිය වශයෙන් පිළිවෙලින් රු.මිලියන 38ක් හා රු.මිලියන 17ක් ගෙවීමට සිදුව තිබුණි.	2024 සැප්තැම්බර් 26 වන විට දේශීය අදායම් දෙපාර්තමේන්තුව වෙත තවදුරටත් ගෙවීමට ඇති බදු මුදල රු.380,633,541 කි.	දේශීය ආදායම් පනත ප්‍රකාරව වර්ෂයට අදාළ ආදායම් බදු, තක්සේරු වර්ෂය අවසන් වී නියමිත කාලය තුළ ගෙවීමට කටයුතු කළ යුතු බව.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,174,795,701 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පාඩුව රු.433,605,111 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,608,400,812 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ඍජු මෙහෙයුම් වියදම් රු. 786,289,596 කින් එනම් සියයට 24 කින් සහ මූල්‍ය වියදම් රු.2,412,224,054 කින් එනම් සියයට 55 කින් අඩුවීම සහ අනෙකුත් ආදායම් රු.1,244,494,425 කින් එනම් සියයට 149 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2005 මැයි 06 දිනැති අංක 415 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2016 පෙබරවාරි 18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ ලිපි අංක 03 හි දක්වා ඇති විධිවිධානයන්ට අනුව නැව් මඟින් භාණ්ඩ ආනයනය කරනු ලබන සියලුම රාජ්‍ය ආයතන විසින් ටෙන්ඩර් කැඳවීමේ දී ප්‍රවාහනය හැර භාණ්ඩවල පිරිවැය සහ භාණ්ඩ පිරිවැය සහ ප්‍රවාහනය වශයෙන් වෙන වෙනම ලංසු ආරාධනා කළ යුතු අතර ගමනාන්තයේදී ප්‍රවාහනය සඳහා ගෙවිය යුතු පදනම මත ලංකා නැව් සංස්ථාව හරහා භාණ්ඩ ආනයනය කිරීම ලාභදායී වේද යන්න සලකා බැලිය යුතුය. ඒ අනුව ලංකා නැව් සංස්ථාව හරහා භාණ්ඩ ආනයනය වඩාත් ලාභදායී වේ නම් "ගමනාන්තයේදී ගෙවිය යුතු පදනම මත නෞභාර පත්‍රයක් යටතේ ලංකා නැව් සංස්ථාවේ යාත්‍රාවක හෝ නැව් සංස්ථාව විසින් නම් කරනු ලබන යාත්‍රාවක නැව් ගත කළ යුතු බවට" ණයවර ලිපියෙහි වගන්තියක් ඇතුළත් කළ යුතු වේ. ඒ අනුව පූර්ණ රාජ්‍ය හිමිකාරත්වයක් ඇති සමාගමක් ලෙස රාජ්‍ය අංශයේ ආනයන භාණ්ඩ ප්‍රවාහනය තුළින් සමාගමේ ලාභදායිත්වය වර්ධනය කර ගැනීමේ හැකියාව පැවතුණ ද 2019 අප්‍රේල් 01 සිට 2024 මාර්තු 31 දක්වා වර්ෂ 5 තුළ සී/ස ලංකා නැව් සංස්ථාව හරහා භාණ්ඩ ආනයනය කරන ලද රාජ්‍ය ආයතන ගණන සහ අවස්ථා ගණන පිළිවෙළින් 2019/20 වර්ෂයේ දී 28ක් සහ 2357 ක් ද 2020/21 වර්ෂයේ දී 22ක් සහ 1925 ක් ද 2021/22 වර්ෂයේදී 23ක් සහ 1300 ක් ද 2022/23	ගෝලීය ආර්ථික අවපාතයක් පැවතීම, කොවිඩ් වසංගතය ඇතුළු රට තුල සහ ලෝකයේ ඇතිවූ අයහපත් තත්වයන් හේතුවෙන් 2020/21, 2021/22 හා 2022/23 මූල්‍ය වර්ෂයන්හිදී සංස්ථාව හරහා ප්‍රවාහනය කරන ලද සිද්ධි සංඛ්‍යාව සංඛ්‍යාත්මකව අඩු විය. තව ද, රාජ්‍ය ආයතන සැලකිය යුතු ප්‍රමාණයක් දැනුවත් කිරීම් සිදුකර ආදායම් වර්ධනය කරගැනීමට නැව් සංස්ථාව විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර රාජ්‍ය හා මූල්‍ය චක්‍රලේඛ 415 අංක MPS/P&D/02/04/08 Vol ii හා 2022 නොවැම්බර් මස 29 දිනැති වරාය, නාවික හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මගින් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩල වෙත දන්වා යැවීමට කටයුතු කර ඇත. ඒ අනුව, 2023/24 වර්ෂයේදී රාජ්‍ය අංශයේ භාණ්ඩ ආනයන/අපනයනය පූර්ණ බහාලුම් සැලකීමේදී විසිසම ඒකක 995 ක් දක්වාත්, තොග කඩන (Less than Container Load) ඒකක 10,820.19 දක්වාත් ආනයන/ අපනයන කරන ලද වාර ගණන 1,008 දක්වාද වර්ධනය වී තිබේ. තවද	රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර ව කටයුතු කරමින් සිය ව්‍යාපාර කටයුතු පුළුල් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමණාකාරිත්වය පියවර ගත යුතු බව.

	වර්ෂයේ දී 27 ක් සහ 821 ක් ද 2023/24 වර්ෂයේ දී 23 ක් සහ 1008 ක් ද වශයෙන් සාපේක්ෂව අඩුවෙමින් පැවතුණි.	2024 අප්‍රේල් 01 වන දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා රාජ්‍ය අංශයේ භාණ්ඩ ආනයන/අපනයන හා සම්බන්ධ භෞතික කාර්යය සාධනය ආසන්න වශයෙන් (Physical Performance) විසිසම ඒකක 750 ක් හා තොග කඩන (Less than Container Load) ඒකක 1,999.842 වන අතර භාණ්ඩ ආනයනය/ අපනයනය කරන ලද වාර ගණන 714 ක් වී තිබේ.	
(ආ)	2005 මැයි 06 දිනැති අංක 415 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව සමාගම විසින් සමාගමේ ප්‍රවාහන මිළ සැපයුම්කරුගේ මිලට වඩා වැඩි වන අවස්ථා වලදී අත්හැරීමේ නිවේදන නිකුත් කළ යුතු අතර නැව්ගත කිරීමෙන් අනතුරුව අත්හැරීම් නිවේදන ඉල්ලා සිටීම, හදිසි මිලදී ගැනීම්, CIF මිල ගණන් මත ප්‍රසම්පාදනය පිරිනමා තිබීම හා වෙනත් හේතු මත සමාගම විසින් 2019/20 වර්ෂය තුළ 319ක් ද, 2020 /21 වර්ෂයේදී 298ක් ද, 2021/22 වර්ෂයේදී 185ක් ද, 2022/23 වර්ෂයේදී 118ක් ද, 2023/24 වර්ෂයේදී 81 ද වශයෙන් චක්‍රලේඛයේ නියමයන්ට බැහැරව අත්හැරීම් නිවේදන නිකුත් කර තිබුණි.	සංස්ථාව විසින් නිකුත් කරනු ලබන මුළු අත්හැරීමේ නිවේදන සංඛ්‍යාවෙන් වැඩි ප්‍රමාණයක් නැව් ගත කිරීමෙන් අනතුරුව අත්හැරීමේ නිවේදන ඉල්ලා සිටීම යන කාණ්ඩය යටතේ නිකුත් කරනු ලබයි. භාණ්ඩ ආනයන කටයුතු වලදී සැපයුම්කරුගේ අභිමතය පරිදි ප්‍රවාහනය සිදුකර ඇති විටෙක, එම භාණ්ඩයන් සඳහා අවශ්‍ය ලිපි ලේඛන, ණයවර ලිපි නිකුත් කර ඇති බැංකුවෙන් නියමිත පරිදි ලබා ගනිමින් ප්‍රමාද ගාස්තු දැරීමෙන් තොරව නිෂ්කාශන කටයුතු කිරීම ඇතුළු විවිධ හේතු නිසා අත්හැරීමේ නිවේදන නිකුත් කිරීමට සිදුව තිබේ. 2023/24 මූල්‍ය වර්ෂයේ සමස්ථ අත්හැරීමේ නිවේදන නිකුත් කල සංඛ්‍යාව පෙර වර්ෂයට සාපේක්ෂව 185 සිට 134 දක්වා අවම කරගැනීමට හැකිවී ඇති අතර, එය 27% ක් වූ අගයකින් පහල ගොස් ඇත.	කළමණාකරණය විසින් රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු බව.

(ඇ)	තරගකාරී නැව් ගාස්තු ක්‍රමයක් මත රාජ්‍ය ආනයනයන්ගෙන් වැඩි ප්‍රතිශතයක් සමාගම වෙත නතුකර ගැනීමට කටයුතු කිරීම මඟින් ලාභදායිත්වය වර්ධනය කර ගැනීමේ හැකියාව පැවතුණ ද සමාගමේ ප්‍රවාහන ගාස්තුව, ආනයනයට සම්බන්ධ සැපයුම්කරුවන්ගේ නැව් ගාස්තුවලට වඩා වැඩිවීම හේතුවෙන් 2019/2020 සිට 2023/24 වර්ෂය දක්වා වර්ෂ 5 තුළ පිළිවෙලින් අත්හැරීමේ නිවේදන 174ක්, 163ක්, 150ක් ,67ක් සහ 53ක් නිකුත් කර තිබුණි.	නැව් ගත කිරීමෙන් අනතුරුව , ආනයන භාණ්ඩකරුවන්ගේ ප්‍රවාහන ගාස්තු (Freight Rates) සමකල නොහැකි වීම, එනම් ඔවුන්ගේ ලංසු ලේඛන වල යථාර්තවාදී නොවන භාණ්ඩ ප්‍රවාහන ගාස්තු (Unrealistic Freight Rates) ඉදිරිපත් කිරීම, හදිසි මිලදී ගැනීම්, විශේෂ ණය පටිපාටියන් යටතේ පූර්ව කොන්දේසි මත කරනු ලබන මිලදී ගැනීම්, CIF වටිනාකම පමණක් සඳහන් කරමින් ප්‍රසම්පාදන ක්‍රියාවලියට සහභාගී වූ සැපයුම්කරුවන්ට ටෙන්ඩරය පිරිනමා තිබීම වැනි අවස්ථාවලදී රාජ්‍ය මූල්‍ය චක්‍ර ලේඛනයට අනුව නිවැරදිව කටයුතු කල යුතු ආකාරය සඳහන් කරමින් ඉදිරි මිලදී ගැනීම් සඳහා වඩාත් ප්‍රශස්ථ ක්‍රියා මාර්ග රාජ්‍ය ආයතන වල අවධානය යොමු කරවීමට සෑමවිටම උත්සාහ කරනු ලැබේ.	නාවුක ක්ෂේත්‍රයේ පවතින දැඩි තරගකාරී තත්ත්වය යටතේ භාණ්ඩ ප්‍රවාහනය සමාගම වෙත නතුකර ගැනීමේ විධිමත් මිල තීරණය කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු බව.
(ඈ)	සමාගමේ 1993-2015 අතර කාල සීමාවේදී මිලදී ගෙන තිබූ රු.මිලියන 9.8 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම 328 ක් අස්ථානගතවී තිබුණු අතර ඒ පිළිබඳව 2023/24 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ ද සඳහන් වී නොතිබුණි. තවද, එම අයිතම 2024 මාර්තු 31 දින වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය වී තිබූ අතර කළමනාකරණය මගින් ස්ථාවර වත්කම් කාලීනව සමාලෝචනය කර අස්ථානගතවී ඇති හෝ ඉවත් කළ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මෙම භාණ්ඩ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග සඳහා සකස් කරන ලද වාර්තාවක් සී/ස ලංකා නැව් සංස්ථාවේ විගණන කමිටුව වෙත ඉදිරිපත් කර ඇති අතර, එමගින් ලැබුණු උපදෙස් අනුව මේ පිළිබඳ ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව විමසා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතද ලිපියක් යොමුකර ඇත.	කළමනාකරණය විසින් ස්ථාවර වත්කම් කාලීනව සමාලෝචනය කර අස්ථානගතවී ඇති හෝ ඉවත් කළ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව.

3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 නොවැම්බර් 10 වන දින සමාගම විසින් පෞද්ගලික සමාගමක් සමග වසර 06 ක කාල සීමාවක් සඳහා සමාගමේ නෞකාවන් වෙනුවෙන් පරිගණකපාදක නැව් කළමනාකරණ	පෞද්ගලික සමාගමට ගෙවීමට නියමිත ඇ.ඩො. 15,400 ගෙවීම සඳහා එම සමාගම විසින් කාර්ය සාධන සුරක්ෂිතය දීර්ඝ කල කල යුතු වුවත් අදාළ සමාගම එය සිදු නොකරන ලද බැවින්, එම මුදල ගෙවීමට ප්‍රශ්නකාරී තත්වයක් ඇතිව	සමාගමේ ඉදිරි මෙහෙයුම් කටයුතු සඳහා මෙම පරිගණක පද්ධතිය සක්‍රීය ව යොදාගැනීම සඳහා කළමනාකරණය විසින් අවශ්‍ය පියවර ගත යුතු බව.

පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට එ.ජ.ඩො 102,800 කට ගිවිසුම් ගතවී තිබුණි. පළමු වර්ෂය තුළ අදියර 03 කින් මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර එහි අත්තිකාරම් මුදල් වෙනුවෙන් රු.මිලියන 2.9 ක් (එ.ජ.ඩො 15,400) සහ පද්ධති සැලසුම් පිළිගැනීම වෙනුවෙන් රු.මිලියන 1.6 ක් (එ.ජ.ඩො 7,700) ක් ලෙස රු.මිලියන 4.5 ක් වැයකර නෞකා 02 සඳහා පද්ධතිය ස්ථාපිත කර සැලසුම්ගත නඩත්තු පද්ධතිය, කාර්යය මණ්ඩල මොඩියුලය සහ HSEQ මොඩියුලය යන පද්ධතීන් හඳුන්වාදී ඇති අතර වසර 03 කුත් මාස 8 ක කාලයක් ගතවී තිබුණද, මෙම පරිගණක පද්ධතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිසි ලෙස ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.	තිබේ. ප්‍රසම්පාදන මොඩියුලය දැනට නිර්මාණය කරන අවධියේ පවතින අතර 20% ක ගෙවීම අවසන්ව පවතින තෙක් එම මොඩියුලය නිර්මාණය කිරීම ප්‍රමාද වී තිබේ. තාක්ෂණ අංශයේ කාර්ය මණ්ඩලයට අමතරව නෞකාවයන්හි කාර්යය මණ්ඩලය සඳහා පුහුණුව ලබා දී ඇති අතර PMS (Planned Maintenance System) සඳහා දත්ත, Crewing Module සඳහා දත්ත, හා HSEQ Module සඳහා දත්ත නියමිත පරිදි ඇතුලත් කර ඇත. මෙම පරිගණක පාදක නැව් කළමනාකරණ පද්ධතිය (CBSMS) දැනට ප්‍රයෝගිකව ප්‍රයෝජනයට ගන්නා අතර ගෙවා ඇති මුදල නිෂ්කාර්ය වියදමක් නොවන බවද සඳහන් කිරීමට කැමැත්තෙමි.	

3.3 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 මාර්තු 31 දිනට සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය 133 ක් වූ අතර වැඩ බලන තනතුරු 01 ක් සහිත ව තථ්‍ය කාර්ය මණ්ඩලය 94 ක් විය. ඒ අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 08 ක්, තෘතීය මට්ටමේ තනතුරු 04 ක් ද්විතීය මට්ටමේ තනතුරු 25 ක් ප්‍රාථමික මට්ටමේ තනතුරු 04 ක් ලෙස සමස්ථ පුරප්පාඩු තනතුරු 41 ක් පැවති අතර එය සමස්ථ අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 30 ක ප්‍රතිශතයක් විය.	2024 මාර්තු 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 94 වූ අතර මේ වන විට එම සංඛ්‍යාව 109 දක්වා වැඩිවී තිබේ.	විධිමත් අනුමැතීන් ලබාගෙන කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සහ පවතින කාර්ය මණ්ඩලය ප්‍රශස්ත ලෙස සේවයේ යොදවා ගැනීමට කටයුතු කළ යුතු බව.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 සංයුක්ත සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදය අනුව සමාගම විසින් උපායමාර්ගික සැලසුම් සහිත සංයුක්ත සැලැස්ම සකස් කර ඊළඟ වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද, 2018 - 2023 අවසන් පස් අවුරුදු සංයුක්ත සැලැස්ම වර්ෂයෙන් වර්ෂයට යාවත්කාලීන කර සංයුක්ත සැලැස්මෙහි අරමුණු ඉටුකිරීම කෙරෙහි අවධානයක් යොමුකර හෝ ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම්වලට අනුකූලව සෑම වසරකදීම යාවත්කාලීන කර නොතිබුණි. තවද, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් කලින් කලට උපායමාර්ගික සැලසුම් ක්‍රියාවට නැංවීමේ සඵලදායිතාව තක්සේරු කර සහතික කළ යුතු අතර අවශ්‍ය නම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතු වුවද එපරිදි කටයුතුකර නොතිබුණි.	සී/ස ලංකා නැව් සංස්ථාවේ උපායමාර්ගික සැලසුම් සහිත සංයුක්ත සැලැස්ම අදාල පාර්ශවයන්ට හා රජයේ විගණන අංශයට මේ වන විට ලබා දී ඇත.	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව උපායමාර්ගික සැලසුම් සහිත සංයුක්ත සැලැස්ම සකස් කර මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු අතර වාර්ෂිකව යාවත්කාලීන කිරීමටද කටයුතු කළ යුතු බව.

4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ආයතනයට අයිති නැව්වල වරලත් කුලී ආදායම, Agency & Address Commission ආදායම, බහාලුම් ප්‍රවාහන ආදායම හා රේගුවෙන් භාණ්ඩ නිෂ්කාශනය හා බෙදාහැරීමේ ආදායම පිළිවෙළින් රු.මිලියන 4,312 ක්, රු.මිලියන 692 ක්, රු. මිලියන 608 ක් හා රු. මිලියන 35 ක් අපේක්ෂා කර තිබුණද කාර්යසාධන වාර්තාව අනුව එම ආදායම පිළිවෙළින් රු.මිලියන 2,476 ක්, රු.මිලියන 548 ක්, රු.මිලියන 568 ක් හා රු.මිලියන 79 ක් විය. ඒ අනුව අපේක්ෂිත ආදායම සහ තත්‍ය ආදායම අතර ප්‍රතිශතාත්මක වෙනස පිළිවෙළින් සියයට 43 ක, සියයට 21 ක, සියයට 7 ක අඩුවීමක් හා සියයට 125.71 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. ඒ අනුව කළමනාකරණය විසින් ආදායම ඇස්තමේන්තු කිරීම යථාර්තවාදීව සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය.	2023/2024 වර්ෂය සඳහා ජාත්‍යන්තර මුහුදේ වරලත් කුලී අදායම අනපේක්ෂිත ලෙස අඩුවීමෙන් ඇති වූ ආර්ථික බලපෑම හේතුවෙන් වරලත් කුලී අදායම ද , 2023/2024 ගල් අඟුරු ප්‍රවාහනය වර්ෂය තුළ සමාගමට නොලැබීම හේතුවෙන් Agency & Address Commission ආදායම ද, රජය විසින් ක්‍රියාත්මක කළ මූල්‍යමය ප්‍රතිපත්ති නිසා රජයේ හා පුද්ගලික ආනයන සීඝ්‍රයෙන් අඩුවී ඇති බැවින් බහාලුම් ප්‍රවාහන ආදායම ද අපේක්ෂිත මට්ටමට වඩා අඩු වී ඇති අතර 2023/2024 වර්ෂය තුළ නව ව්‍යාපාරික අවස්ථා සොයා ගැනීමේදී ප්‍රතිඵලශීලී උපාය මාර්ග යෙදවූ නිසා රේගුවෙන් භාණ්ඩ නිෂ්කාශනය හා බෙදාහැරීමේ ආදායම අපේක්ෂිත මට්ටමට වඩා වැඩි වී ඇත.	ආයතනයේ අපේක්ෂිත අරමුණුවලට ළඟා විය හැකි වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම විධිමත් ව සකස් කිරීමටත් ප්‍රගතිය පසු විපරම් කිරීමටත් අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමටත් කළමනාකාරීත්වය කටයුතු කළ යුතු බව.